# සංස්කෘත කෝෂ සහ නිඝණ්ටු සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්

කළුවානේ කුමාරකස්සප හිමි

## Abstract

**Kośa** and **Nighaṇṭu** are Lexicographical works and two types of scientific texts in Sanskrit Literature. However, these differ in many respects. The **Nighaṇṭu** is the oldest one and its purpose was essentially the interpretation of sacred Vedic texts. The **Kośa** texts were prepared to assist the poets in their writings. Further, the **Nighaṇṭus** contained nominal and verbal forms and dealt with one particular text. The **Kośas** are in verse, including nouns and indeclinables not based on any particular text.

The oldest works on lexica have come as fragments only. One of the earliest texts, the Amarakośa, was composed by **Amarasiṅha**, who was a Buddhist. This work is synonymous and arranged in three chapters by subjects, on homonyms, indeclinables, and genders. First chapter includes the words of heaven, gods, atmosphere, stars, time, word, language, sound, music, dance, snakes, sea, water, island, river, water animals and water plants etc. Chapter number two contains words for the earth, city, mountain, forest, trees, plants, animals, man,

woman, relationships, illness, body parts, different kinds of garments, ornaments, the four castes, and their professions. The third chapter contains adjectives, compound words, and supplements on homonyms, indeclinables, and the gender of nou ns.

There were many commentators on the **Amarakośa**, and the later lexicographical works also related to **Amarakośa**. This article aims to explain the history of Sanskrit **Kośa** and **Nighaṇṭu** literature briefly, and it will open a window to investigate the one part of scientific work on Sanskrit literature.

***Keywords:*** *Lexicography, Kisa, Nighantu, Dictionary, Etimology.*

**යතුරු පද** : අර්ථව්‍යාඛ්‍යාන, කෝෂ, නිඝණ්ටු, ශබ්දකෝෂය, නිරුක්ත.

**හැඳින්වීම**

ලොව පවතින සෑම භාෂාවකටම අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රමවේදයක් ඇත. ව්‍යාකරණය සාහිත්‍යකරණය මෙන් ම නිඝණ්ඩුකරණය ද දියුණු භාෂාවක අවශ්‍යතම හා වැදගත් ම කොටසක් ලෙස දැකිය හැකි ය. භාෂාවක සාහිත්‍යය සම්පූර්ණ වීම සඳහාත්, භාෂාවක පෘථුලත්වය සඳහාත් වැදගත් ම වූ කාර්යයක් නිඝණ්ඩු හා කෝෂ සාහිත්‍යයකින් සිදුවෙයි. නිඝණ්ඩු ග්‍රන්ථයන් පෙරපර දෙදිග භාෂාවල දක්නට ලැබෙන අතර, ඒ සඳහා විවිධ වූ අර්ථකථනයන් ද දැකිය හැකි ය. සංස්කෘත භාෂාවෙහි නිඝණ්ටු, පාලි භාෂාවෙහි නිඝණ්ඩු, ඉංග්‍රීසි භාෂාවෙහි Lexikon හා Dictionary ග්‍රීක භාෂාවෙහි Lexikon යනුවෙනුත් සඳහන් වන්නේ සිංහලයේ හැඳින්වෙන මෙම කෝෂ ග්‍රන්ථයෝ යි. කෝෂ ග්‍රන්ථයක් හෙවත් නිඝණ්ඩුවක් යනු කුමක් ද යන්න උක්ත භාෂාස්ථ පද විග්‍රහ කිරීමෙන් අවබෝධ කරගත හැකි ය.

**නිරුක්ත1:1 - 'නිගමා ඉමෙ භවන්ති, ඡන්දෝභ්‍යඃ සමාහෘත්‍ය සමාහෘත්‍ය සමාම්නාතාඃ' (වීරසූරිය: 1991,23).**

**නිරුක්ත1:1 - 'තෙ නිගන්තව එව සන්තො නිගමනාත් නිඝණ්ටව උච්‍යන්ත**

**ඉතොඃපමනාප්‍යවඃ අපි වා හනනාදෙව ස්‍යුඃ සමාහතා භවන්ති යදවා සමාහෘතා භවන්ති' (වීරසූරියඃ 1991,23).**

**හේමචන්ද්‍රකොෂ - 'නිඝණ්ටුර්නාමසංග්‍රහඃ' ( වීරසූරියඃ 1991,24).**

**Oxford Advance Learner's Dictionary** - 'Lexicon' 1. All the words and phrases used in a particular language or subject; all the words and phrases used and known by a particular person or group of people.

2. A list of words on a particular subject or in a language in alphabetical order. **(wehmeier: 2003, 739)**.

**සිංහල විශ්ව කෝෂය** - 'නිඝණ්ඩු නම් නාම නිඝණ්ඩුයැ. භේද ත්‍රිකාණ්ඩ උත්පලිනී අමරමාලා සෙයින් වෘක්ෂාදීන්ගේ පර්යාය වචන ප්‍රකාශ කිරීමේ ශාස්ත්‍රයයි..' **(හෙට්ටිආරච්චිඃ 1963, 614).**

උක්ත නිර්වචන සියල්ල සසඳා බැලීමෙන් පෙනී යනුයේ සෑම භාෂාවක ම කෝෂ යන්නෙහි අර්ථය ලෙස කිසියම් පදයක් සඳහා කරනු ලබන පර්යාය පද සංගෘහිත කිරීම, අර්ථ ගැන්වීම, ශබ්දාර්ථ බෙදා දැක්වීම, ගැටපද හෝ විවරණ දැක්වීම ආදිය යන්නයි. ඒවා විශේෂාකාරයෙන් පෙළගැස්වීම, ගොනු කිරීම කෝෂ ග්‍රන්ථවල ලක්ෂණය යි.

**අරමුණ**

සංස්කෘත සාහිත්‍යයේ කාව්‍ය නාට්‍ය අලංකාරාදි අංශ පිළිබඳ විමර්ශනය කිරීම සුලභ වශයෙන් සිදුවුවද සංස්කෘත කෝෂ සහ නිඝණ්ටු සාහිත්‍යය පිළිබඳ එවැනි විමර්ශනයන් දුර්ලභය. එම විෂය අධ්‍යයනය කරන විද්‍යාර්ථීන් මෙන්ම පර්යේෂණ සීමිත වීම නිසාවෙන් වටිනා සාහිත්‍යාංගයක් නිලීන වී ඇත. කෝෂකරණය සාහිත්‍යකරණයේ අවශ්‍යාංගයක් වශයෙන් වැඩීතිබෙන අතර සංස්කෘත සාහිත්‍යයේ විද්‍යමාන විශේෂ ලක්ෂණ අනුව ව්‍යාඛ්‍යාන සම්ප්‍රදායට අනුපූරක වශයෙන් කෝෂ කෘතිවලින් විශාල මෙහෙයක් ඉටු වී ඇත. නූතන ශබ්දකෝෂයකින් ඉටුවන අර්ථය සලකා බලන විට සංස්කෘත සාහිත්‍යයේ විද්‍යාමාන කෝෂ හා ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවලින්ද එම අර්ථයම සිදුවන බව පෙනේ.

මෙම විෂය පිළිබඳව මහාචාර්ය ඒ.බී. කීත් සිය **සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය** කෘතියේද මහාචාර්ය ඒ.ඒ මැක්ඩොනල් **සංස්කෘත සාහිත්‍යය** ග්‍රන්ථයේද විෂය පරිශිෂ්ටයක් ලෙස දක්වා ඇති තොරතුරු අල්පය. රාමාවතාර ශර්මා පඩිතුමා විසින් **කල්පද්‍රුමකෝෂ** ග්‍රන්ථයට කළ සංස්කරණයේ ප්‍රස්තාවනාවක් වශයෙන් සමස්ත සංස්කෘත කෝෂ සාහිත්‍ය පිළිබඳ වටිනා ශාස්ත්‍රිය විමර්ශනයක් යොදන ලදී. එම ප්‍රස්තාවනාවද පදනම්කර ගනිමින් සිංහල පාඨකයන් සඳහා ජිනසෝම වීරසූරිය විසින් **සංස්කෘත කෝෂ සාහිත්‍යය** නමින් කෘතියක් සම්පාදනය කරන ලදී. එහි සංස්කෘත කෝෂ සාහිත්‍යයේ ආරම්භයේ සිට එහි විකාසය අඛණ්ඩ ව්‍යාපාරයක් වශයෙන් සිදු වී ඇති අයුරු දක්වා තිබීම අතිශයින්ම වැදගත්ය. මෙම ලිපිය සම්පාදනයේ දී ඉහත සඳහන් විමර්ශනයන් පාදක කරගනිමින් කරුණු සංක්ෂිප්තව දැක්වීම මෙහි අරමුණයි.

## නිඝණ්ටු හා කෝෂ සාහිත්‍යයේ ඉතිහාසය

නිඝණ්ටු හා කෝෂ සාහිත්‍යයේ ඉතිහාසය විමසීමේ දී මෙම වර්ග දෙක දෙකක් ද, එසේ නැතහොත් එකක්මදැ යි යන්න විමසිය යුතු ය. නිඝණ්ටු යන්න සංස්කෘතයේ දී හමුවනුයේ වෛදික සාහිත්‍යය සම්බන්ධව ය.

'නිඝණ්ටු සාහිත්‍යය ගැන පරීක්ෂා කර බලන කළ දත හැකිව තිබෙන්නේ කවීන්ට වචන සැපයීමට කෝෂ ග්‍රන්ථ පිළියෙල වූවාක් මෙන් දිනෙන් දින දුරවගම්‍යවන වෛදික පාඨ තේරුම් කරදීමේ අදහසින් වන බව ය.' **(සේනානායකඃ 1963, 623).**

'නිඝණ්ටුවල ප්‍රයෝජනය වෛදික භාෂාව හා එහි ව්‍යාකූල පද හැදෑරීමට පමණක් සීමා වීමයි.' **(තිලකසිරිඃ 1999, 206).**

මේ අනුව, නිඝණ්ටු හා කෝෂ අතර අන්තර්ගතය පිළිබඳ ව සැලකිය යුතු වෙනස්කම් කිහිපයක් දක්නට ලැබෙයි.

නිඝණ්ටුවල ලක්ෂණ මෙබඳු ය.

1. වෛදික භාෂාව හා එහි ව්‍යාකූල පද හැදෑරීම.
2. නාම රූපයක් හා ක්‍රියා රූපයක් අඩංගු ය.

3. ඍග්වේදය ආශ්‍රය කොට සකස් කර ඇත.
4. කෝෂවල මුල් පියවරයි.
5. වචන ලැයිස්තු ගද්‍ය ස්වරූපයෙන් රචිත ය.
6. නිඝණ්ටුවල පද සංග්‍රහ හා නිරුක්ත එක්කොට සැලකූවිට වර්තමාන ශබ්ද කෝෂයනට ලංවන මුල් ම ස්වරූපය යි.

කෝෂවල ලක්ෂණ මෙසේ සංග්‍රහ කළ හැකි ය.

1. කවීන්ට හා රචකයන්ට ප්‍රයෝජනවත්වන අයුරින් වාඞ්මාලා හා පර්යාය නාම ඇතුළත් ය.
2. මූලාරම්භය නිඝණ්ටු ය.
3. නාම පද හා නිපාත පද පමණක් සංගෘහිත ය.
4. විශේෂ කෘතියකට සීමා නොවේ.
5. පද්‍යයෙන් රචිත ය.
6. ශ්ලෝකවෘත්තයෙන් රචිත ය.
7. අලංකාර ශාස්ත්‍රීය ග්‍රන්ථයක් හා කවීන්ට රචනයෙහි අවශ්‍ය අත්පොත් ය.

මේ අනුව පැහැදිලි වනුයේ ලෞකික සාහිත්‍යයේ පැනෙන කෝෂ ග්‍රන්ථයන්හි මූලාකෘති වෛදික නිඝණ්ටු බවයි.

නිඝණ්ටු ග්‍රන්ථයන්හි ඉතිහාසය විමසීමේ දී වෛදික අර්ථ ව්‍යාඛ්‍යාන පිළිබඳ ව අවධානය යොමුකළ යුතුයි. ශ්‍රැතිය වශයෙන් සැලකෙන වේදය නිදොස් ව ආරක්ෂා කර ගැනීමත්, ඒ හා ආශ්‍රිත විධි අත්‍යන්තයෙන් නිවැරදි ව පවත්වා ගැනීමත් සිය මුඛ්‍ය කාර්යය කොටගත් වෛදික චරණයන් විසින් විවිධ අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රමවේද අනුගමනය කරන ලදී. වේදය ආරක්ෂා කර ගැනීම සඳහා ස්මරණ උපාය (memonicmelhods) ලෙස පාඨ ක්‍රම අනුගමනය කරන ලදී.

ක්‍රම පාඨ, ජටා පාඨ, ගණ පාඨ, සංහිතා පාඨ, පද පාඨ, මාලා පාඨ යනාදිය ඉන් කිහිපයකි. මෙම පද පාඨ හා සංහිතා පාඨ යනාදිය සකස් කිරීම සඳහා භාවිත කරන ලද ව්‍යාකරණ රීති දක්වන ග්‍රන්ථ

ප්‍රාති ශාඛ්‍ය කෘති වශයෙන් සලකනු ලැබේ. සංස්කෘතයේ පැරණිත ම ව්‍යාකරණ කෘති ලෙස සැලකෙන ප්‍රාතිශාඛ්‍ය කෘති අතර ඍක් ප්‍රාතිශාඛ්‍යය පැරණිත ම කෘතියකි. ශෞනක නැමැත්තකු විසින් රචිත ය.

වෛදික සංහිතාවල ඇතුළත් පුද පිළිවෙත් විස්තර කරමින් බ්‍රාහ්මණ ග්‍රන්ථ රචනා කොට ඇත. යාගය පිළිබඳ ක්‍රියාවන්ට සෑම මන්ත්‍රයක් ම අයත් සේ දක්වා ඒ අනුව මන්ත්‍රවල අර්ථ ව්‍යාඛ්‍යානය කොට ඇත. යම් සම්මත නිර්වචනයකින් පදයක අවශ්‍ය අර්ථය ප්‍රකට නොවූ කල අනියම් ක්‍රමයකින් හෝ එම අර්ථය ඉස්මතු කර ගන්නට කළ වෑයමක් බ්‍රාහ්මණ ග්‍රන්ථවල දක්නට ලැබේ. වේද සංහිතාවන්ගේ මුල්ම ව්‍යාඛ්‍යාන කෘති ලෙස බ්‍රාහ්මණ ග්‍රන්ථ වැදගත් ය. බ්‍රාහ්මණවල අර්ථ ව්‍යාඛ්‍යානය සඳහා යොදාගෙන ඇති ක්‍රම කිහිපයක් දක්නට ලැබෙයි.

1. වෛදික කෝෂයේ වචන වෙනුවට නව වචන යෙදීම.
2. දුර්ලභ ලෙස සැලකෙන වචන වෙනුවට වඩා ප්‍රචලිත වචන යෙදීම.
3. අනේකාර්ථ වචන වෙනුවට අර්ථය නිශ්චිතව හඟවන ඒකාර්ථ වචන යෙදීම.
4. යාඥික වචන වෙනුවට සමාන වෙනත් වචන යෙදීම.
5. වචනවල නිරුක්ති දැක්වීම.
6. දුෂ්කර, දුර්බෝධ වචන අර්ථ ව්‍යාඛ්‍යානය නොකොට තිබීම.

බ්‍රාහ්මණ කෘතීන්ට අනතුරුව අර්ථ ව්‍යාඛ්‍යානය අතින් වැදගත් වූවක් ලෙස වේදාංගයන් සැලකිය හැකි ය. බ්‍රාහ්මණ හා ආරණ්‍යකවල අන්තර්ගත වූ මෙම වේදාංග කොටස් පසුව වෙනම සාහිත්‍යයක් ලෙස වර්ධනය විය. වේදාංගයට අයත් වනුයේ ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති හා ඡන්දස්, ජ්‍යෝතිෂ යන කොටස් ය. ශික්ෂා යන්නෙන් පඨන විෂයක හැකියාව අදහස් වෙයි. පඨනය හෙවත් සංහිතාවන්ගේ නියම උච්චාරණය, ස්වරණය ආදිය ඉගෙනීම එයින් අදහස් වෙයි. සංහිතා පාඨ හා පද පාඨ සකස් කිරීම ශික්ෂා ශාඛාවෙන් මුලින් ම සිදුවී ඇත. ශික්ෂා වේදාංගයට අයත් මුල්ම කෘති ලෙස සැලකෙන්නේ

**ප්‍රාතිශාඛ්‍ය** කෘතිය ය. මේවායෙහි සංස්කෘතයේ ශබ්ද වර්ග කිරීම ස්වභාවික වූස, විද්‍යානුකූල වූද පිළිවෙළට දක්වා ඇත. ව්‍යාකරණ අධ්‍යයනයෙහි ආරම්භය ද මෙම කෘතිහුම ය.

ව්‍යාකරණ ශාස්ත්‍රයේ දී මෙන් ප්‍රකෘති ප්‍රත්‍යයා දී වශයෙන් පද විග්‍රහ කොට, වාක්‍යවල පදයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධය විමසා බැලීම නොව වෛදික මන්ත්‍රවල අන්තර්ගත වෙන් වෙන් වූ අංග සම්පූර්ණ වූ පද විමසා බැලීම ම ප්‍රාතිශාඛ්‍යයන්ගේ අරමුණයි **(වීරසූරියඃ 1991, 10).** 'සෘචාංලක්ෂණමාහ ශෞනකඃ' යැයි සෘග්වේද ප්‍රාතිශාඛ්‍යයෙහි කියූ සේම පද පාඨගත පද එලෙසින් ම ගෙන මන්ත්‍ර ස්වරූපයෙන් පඨනයේ දී එහි වන විපර්යාස ප්‍රාතිශාඛ්‍යවල ඉගැන්වේ. එමෙන් ම උච්චාරණය, ස්වරණය ආදිය ඉගැන්වෙන එම කෘතිවල යම් යම් යාඥික ක්‍රියා ආශ්‍රිත ව යම් යම් අක්ෂරයක් නොහොත් පදයක් ශබ්ද කිරීමේ විශේෂ නොහොත් නියම පිළිවෙළ ද විස්තර කෙරේ. යාඥික මත ඇසුරු කොට පදයන්ගේ අර්ථ කිරීම, විද්‍යමාන ආදිම යාස්කගේ නිරුක්ති ග්‍රන්ථයේ ද අනුගමනය කොට ඇති පිළිවෙළයි.

**යාස්කගේ නිරුක්ති ග්‍රන්ථය** අර්ථ ව්‍යාඛ්‍යාන සම්ප්‍රදායේ වැදගත් අවස්ථාවකි. එහි භාෂා ප්‍රයෝගයේ ප්‍රභේද ද වාක්‍ය වර්ග ද වෙන් කොට දක්වන යාස්කාචාරීහු නාම, සර්ව නාම, ආඛ්‍යාත, උපසර්ග යනු වශයෙන් වචන විග්‍රහ කරත්. යාස්ක ප්‍රාතිශාඛ්‍ය විශේෂයක් දැන සිටි බවත්, එම කෘති පුරාණතම ව්‍යාකරණ කෘති බවත්, සලකනු ලැබේ **(වීරසූරියඃ 1991,14).** යාස්ක නිරුක්තියේ 'නෛඝණ්ඨුක කාණ්ඩ' කොටසෙහි වෛදික වචන මාලා රාශියක් එක් කොට ඇත. ජයදේව තිලකසිරි එහි එන උද්ධෘතයක් නිදසුන් ලෙස දක්වා ඇත. එනම් 'රාත්‍රිය' යන්නට පර්යාය නාම විසිතුනක් ම සඳහන් කොට ඇති බවයි. යාස්කගේ නිරුක්ති ග්‍රන්ථයෙහි මුල්ම කෝෂ ග්‍රන්ථය සැඟවී ඇතැයි විද්වත්හු සලකති. එබැවින් ඒ පිළිබඳ විස්තර පසුවට තබා ව්‍යාකරණ කෘති නිපදවීම ද අර්ථ ව්‍යාඛ්‍යානයේ ම තවත් දියුණු අවස්ථාවක් ය යන්න විමසා බලමු.

ශාකල්‍යයන් සෘග් වේදයට සැපයූ පද පාඨයෙන් ද, ප්‍රාතිශාඛ්‍ය කෘතීන්ගෙන් ද, ශික්ෂා' නම් සූත්‍ර විෂයෙන් ද ව්‍යාකරණ විද්‍යාව හැදෑරීම ක්‍රමවත් ව ඇරඹිණි. පද පාඨයෙහි වාක්‍ය, නාම පද, සමාස පද ආදිය විග්‍රහ කිරීම සිදු වී ඇත. යාස්කගේ නිරුක්තිය ද

ව්‍යාකරණ විද්‍යාවට මහත් එළියක් සැපයූවකි. 'වචන විග්‍රහ කිරීම' යන අදහසින් ව්‍යාකරණ (වි -ආ - කෘ) යනු මේ විද්‍යාවට භාවිත වන්නට ඇතැයි මේ සාක්ෂ්‍ය අනුව පිළිගත හැකිවේ **(තිලකසිරි: 1999, 209).** ව්‍යාකරණය අතින් වැදගත් ම කෘතිය ලෙස විද්‍යාමාන වනුයේ පාණිනීගේ අෂ්ටාධ්‍යායීය ව්‍යාකරණය යි. පාණිනී ව්‍යාකරණයට ශාස්ත්‍රීය පදනමක් වූයේ වේද භාෂාවේ යම් යම් විශේෂතා එක්රැස් කොට සසඳා බලා බැසගත් නිගමනයෙනුයි. ශබ්දානුශාසනයක් වශයෙන් හැඳින්වෙන පාණිනීය ව්‍යාකරණයෙන් සංස්කෘතයේ කෝෂකරණය අතින් වැදගත් වන තොරතුරු රැසක් ද හෙළි වේ. මෙහි පාණිනීට පෙර සිටි ව්‍යාකරණඥයින් 64 දෙනෙකු ගැන සඳහන් වෙයි. මොවුන්ගේ කෘතීන් කිසිවක් ඉතිරිව නැත. ඔහු සඳහන් කරන නම් අතර ශාකටායන, ආපිශ්වාලී හා ශෞනක යනු කිහිප දෙනෙකි.

පාණිනීන්ගේ කෘතියෙන් පැහැදිලි වන කරුණ නම් ඔහු පුරාණ ලේඛකයන් බොහෝ දෙනෙකුගේ කෘති සංක්ෂිප්ත කර ලියූ බවයි **(සේනානායක: 1965, 641).** අෂ්ටාධ්‍යායී කෘතිය තුළ ඉතාමත් ම කෙටි වාක්‍යවලින් තැනුණු සූත්‍ර දක්නට ලැබෙන අතර එහි වචන දෙක තුනකට වඩා සාමාන්‍යයෙන් දක්නට නැත. එහෙත් මෙම සංක්ෂිප්ත වාක්‍යයන්ගෙන් තැනුණු සූත්‍ර සමූහයෙන් මුළු සංස්කෘත භාෂාවේ ආකෘතිය හා වින්‍යාසය සියලු ආකාරයෙන් සංග්‍රහකොට ඇත. මෙම ව්‍යාකරණ කෘතියට සැපයුණු විශාලතම සවිස්තර විවරණය **පතඤ්ජලීගේ මහාභාෂ්‍යය** යි. මෙලෙස පාණිනී විසින් ව්‍යාකරණ පක්ෂයෙන් ඇරඹි සංස්කෘත භාෂාවේ ඉදිරි ගමන කෝෂකරණය කෙරෙහි ද බලපෑවේ ය. පාණිනීන්ගේ නියම පරමාර්ථය නිරුක්තියට බැසීම වූ හෙයින් ඉඳහිට පද සාධනය හෝ වාක්‍යයක වචන සන්ධි කිරීම වැනි තැනෙක දී හැර සෙසු තැන්හි දී වාග් ලක්ෂණයන් වැනි දෑ ගැන පාණිනී සිත යොමු නොකරයි. පාණිනී නීතීන් බොහොමයක් ම සන්සන්දනාත්මක වාග් විද්‍යාව විසින් සනාථ කරනු ලබන හෙයින් පොදු වශයෙන් නිවැරදි වූ නීතීහු වෙති **(මැක්ඩොනල්ඩ්: 1964).** පද සංග්‍රහ සම්පාදනය කෙරෙහි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අතිශයින් ම බලපා ඇත.

## සංස්කෘතයේ පැරණිම කෝෂ ග්‍රන්ථය

පැරණිතම කෝෂ කෘතිය විද්‍යාමාන වනුයේ තවත් කෘතියක

අන්තර්ගතයෙහි ය. එනම් යාස්කාචාරීන්ගේ නිරුක්ත ග්‍රන්ථය තුළය. එහි 'නිඝණ්ටු' නමින් පද සංග්‍රහයක් විද්‍යාමාන වෙයි. මෙම කොටස විද්‍යාමාන මුල්ම කෝෂ සංග්‍රහයේ ආකෘතිය යි. යාස්ක ස්වකීය නිරුක්ත ග්‍රන්ථයේ අරමුණ ගැනත් ඊට වස්තු වූ පද සංග්‍රහය ගැනත් වැදගත් වූ තොරතුරු රැසක් නිඝණ්ටු සංග්‍රහයේ ආරම්භක වාක්‍යයෙන් ඉදිරිපත් කරනු ලබයි.

'සමාම්නායඃ සමාම්නාතඃ ස ව්‍යාඛ්‍යතව්‍යඃ තම්මං සමාම්නායං නිඝණ්ටව ඉත්‍යාචක්ෂතෙ' **(වීරසූරිය ඃ 1991; 21).**

මෙහි (සමාම්නායඃ) යනු ව්‍යාඛ්‍යානය කටයුතු පද සංග්‍රහය බවත්, එම 'සමාම්නාය' නිඝණ්ටු යනුවෙන් හැඳින්වෙන බවත් යාස්ක කියයි. 'නිඝණ්ටවඃ' යනුවෙන් බහු වචනයෙන් හඳුන්වා තිබීමෙන් එම පද සංග්‍රහයේ ඇතුළත් එක් එක් පදයක් නිඝණ්ටුවක් වශයෙන් යාස්කාචාර්යයන් සලකා ඇත.

'සමාම්නාය' යන පදය නිඝණ්ටු සම්බන්ධයෙන් වැදගත් ය. එයින් නිඝණ්ටු ම සංකේතවත් කරයි. මෙම පදය විග්‍රහ කිරීමෙන් පුරාතන කෝෂයේ ස්වභාවය හා ඇතැම් ලක්ෂණ ප්‍රකට වෙයි. මෙම පදය ඓතරෙය ආරණ්‍යකයෙහි 'අක්ෂර සමාම්නාය' යනුවෙන් අක්ෂර සංග්‍රහය යන අරුතින් යෙදී තිබේ. වාජසනෙයී හා තෛතරීය ප්‍රාතිශාඛ්‍යයෙහි ද 'සංග්‍රහය' අරුතින් ම යෙදී ඇත **(වීරසූරියඃ1991,21).** යාස්කගේ නිරුක්තියට ටීකාවක් සපයන දුර්ගාචාර්යයන් විසින් 'සමාම්නාය' යන්න මෙලෙස ව්‍යාකරණානුකූලව දක්වයි.

සමාම්නාය - සං + ආ √ම්නා (අභ්‍යාස කිරීම්) ධාතුවෙන් භින්නය.

තව ද, සමාම්නාය යනු 'සමභ්‍යස්‍යතෙ මර්යාදයා අයම්' යනුවෙන් යම් යම් සීමාවන් ඇතිව සිත්හි ධාරණය කරගනු ලබන, කට පාඩම් කිරීම සඳහා සකස් කළ සීමා සහිත කෘතියකැ යි දුර්ගාචාර්යයන් හඳුන්වයි. මේ අන්ව මෙම පද්‍යයෙන් අරුත් තුනක් විශද වෙයි.

i. සම්ප්‍රදාය වශයෙන් පවත්වා ගැනීමකි.

ii. සිත්හි ධාරණය කරගනු ලබන්නකි.

iii. කට පාඩම් කිරීම සඳහා සකස් කළ සීමා සහිත කෘතියකි.

යාස්කගේ වෑයම නිරුක්ත ශාස්ත්‍රයේ අනුසාරයෙන් වේදයේ අර්ථ

ව්‍යාඛ්‍යානය කිරීමයි. එනම් නිඝණ්ටු නම් වචන එකතුව නිරුක්ති මාර්ගයෙන් තේරුම්කර දීමයි. නිරුක්ති ශාස්ත්‍රය වේදය පිළිබඳ වූ අංග ශාස්ත්‍රයක් පමණි. සංස්කෘතයේ අග්‍රගණ්‍ය නිරුක්තකරු යන අභිධානය ද යාස්කට හිමිවේ. ඔහුගේ මුඛ්‍ය අරමුණ නිඝණ්ටු පදවල නිරුක්ති කිරීමයි. එහෙත් එම අරමුණ දෙවෙනි වනුයේ වේදයේ අර්ථකථනයන්ට ප්‍රමුඛත්වය ලැබීමෙනි.

යාස්ක විසින් අර්ථව්‍යාඛ්‍යාන කොට ඇති නිඝණ්ටු පද සංග්‍රහය ආධ්‍යාය පහකට ද, වෛදික් පද 1765කින් - ලක්ෂ්මන් සරුප් සංස්කරණය අනුව පද 1771කින් - සමන්විත කෝෂයකි. මෙහි මුල් ආධ්‍යාය තුන නෛඝණ්ටුක කාණ්ඩය නමින් ගැනේ. සිව්වැනි ආධ්‍යාය නෛගම කාණ්ඩය වන අතර, පස්වැන්න දෛවත කාණ්ඩය නම් වෙයි. නෛඝණ්ටුක කාණ්ඩයේ සමානාර්ථ පද ද, නෛගම කාණ්ඩයේ නානාර්ථ පද ද, දෛවත කාණ්ඩයේ දේවතාඛ්‍යාන වාද විෂයක හා යඥ විෂයක පද ද සංග්‍රහ කොට තිබේ. නෛඝණ්ටුක කාණ්ඩයේ නමින් මුළු කෘතියම නිඝණ්ටු යනුවෙන් හඳුන්වා ඇත.

කෝෂ සාහිත්‍යයේ මූලාරම්භය පෙන්නුම් කරන නිඝණ්ටු පද සංග්‍රහ සකස් කිරීමේ දී අකාරාදී පිළිවෙළක් හෝ අන්කිසි පිළිවෙළක් හෝ අනුගමනය කර ඇති බව නොපෙනේ. අර්ථ දැක්වීමක් නැති හෙයින් **නිඝණ්ටු පද සංග්‍රහය** දැනට ව්‍යවහාර වන විදියේ ශබ්දකෝෂයක් නොවන අතර, අරමුණ විසින් හා ස්වරූප විසින් එය පසු කාලයේ කෝෂවලට ද වෙනස්වේ **(වීරසූරිය:1991,32)**. පද විග්‍රහ සඳහා නිරුක්ති ශාස්ත්‍රය අනිවාර්යයෙන් දත යුතු බව යාස්ක පෙන්වා දෙයි. අංග එකකින් හෝ වැඩි ගණනකින් සමන්විත වූ තද්ධිත සමාසාදිය පළමුවෙන් වෙන වෙන ම විග්‍රහ කොට අනුපිළිවෙළින් ඒවායේ අර්ථ කිව යුතු බව යාස්ක නියම කරයි. නිතර ම ව්‍යවහාර භාෂාව හා වේද භාෂාව අතර සාම්‍යයක් මතුකර පෙන්වීමට යාස්ක උත්සුක වී ඇත. අඩුපාඩු සහිතව වුව ද කෝෂ ඉතිහාසයේ සමාරම්භක කෘතියක් වීමට යාස්කගේ නිරුක්ති ග්‍රන්ථයට හැකිවීමත්, පසුකාලීන කෝෂ ග්‍රන්ථයන්ට මගපෙන්වීමත් අගේ කටයුතුය.

## කෝෂ සාහිත්‍යයේ මුදුන් මල් කඩ අමර කෝෂය

දැනට විද්‍යමාන සෑම අතින් ම පෝෂිත වූ පරිපූර්ණ කෝෂ ග්‍රන්ථය

අමරසිංහයන්ගේ **නාමලිංගානුශාසනය** යි. මෙහි වඩාත් ප්‍රචලිත නාමය **අමරකෝෂය** යි. අමරසිංහයන් කවියෙකු වශයෙන් ද ප්‍රචලිත ය. මොහු මහායාන ධර්මය සහ කාලිදාසගේ කෘති පරිශීලනය කළ බෞද්ධයෙකු බව කියවේ. මොහු විසූ කාලය පිළිබඳව විමසීමේ දී සවැනි සියවස බව පිළිගත් මතයයි. වික්‍රමාදිත්‍යගේ රාජසභාවෙහි විසූ කවියෙකු ලෙස සලකනු ලබයි. ගුප්ත යුගයේ විසූවෙකු ලෙස අමරකෝෂට සිය කෘතිය කිරීමට මූලාශ්‍රය වූ සාහිත්‍ය දියුණුවක් එකළ පැවතී ඇත. අමරසිංහට වෛදික සාහිත්‍යය මෙන්ම ලෞකික සාහිත්‍යය ග්‍රන්ථයන් ද මූලාධාර වී ඇත. ඒවා අතර පුරාණ ග්‍රන්ථ, අර්ථ ශාස්ත්‍ර, කාම ශාස්ත්‍ර, වෛදික ශාස්ත්‍ර හා කාව්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථ සැලකිය හැකිය.

මෙම ශාස්ත්‍ර ඇසුරින් ලබාගත් දැනුමට අමතර ව කෝෂ සම්පාදනය කිරීමෙහි ලා එම වර්ගයේ ම පූර්ව කෘති ගැන අමරකෝෂ ටීකා හා වෙනත් කෝෂ ග්‍රන්ථ ඇසුරින් තොරතුරු දක්නට ලැබේ. කෝෂ කෘති රචනා කිරීම සංස්කෘත කාව්‍යය රචනයට ප්‍රතිෂ්ඨා වශයෙන් කරන ලද අතර, හුදෙක් පාණ්ඩිත්‍යය පළකිරීම සඳහා නොව හිතාමතා තෝරාගත් වචන සංග්‍රහ කිරීමක් වශයෙන් අමරකෝෂය රචිත ය.

අමරසිංහ සිය ග්‍රන්ථාරම්භයේ දී බුදුගුණ සිහි කරයි. ඔහු බෞද්ධයෙකු වුවද ඔහුගේ කෘතිය හින්දු සමාජය මහත් ඉහළින් පිළිගෙන ඇත. අමරකෝෂයට රචිත ව්‍යාඛ්‍යාන රාශියකි. මෙම ව්‍යාඛ්‍යාන විවිධ ආගමිකයන් විසින් රචනා කොට ඇත. සුභූතිචන්ද්‍ර වැනි බෞද්ධයන් ද, අෂාධර පණ්ඩිත හා නාචිරාජ වැනි ජෛනයන් ද, ක්ෂීරස්වාමීන්, මල්ලිනාථ, අප්පයිය දික්ෂිත ආදී බ්‍රාහ්මණයන් ද මෙම ව්‍යාඛ්‍යාන සපයා ඇත **(වීරසූරියඃ 1991, 88).**

අමරකෝෂයෙහි අන්තර්ගතය විමසීම සුදුසු ය. මෙහි ප්‍රධාන කාණ්ඩ තුනක් දක්නට ලැබෙයි.

i. ස්වරාදී කාණ්ඩය.

ii. භූම්‍යාදී කාණ්ඩය.

iii. සාමාන්‍ය කාණ්ඩය.

ස්වරාදී කාණ්ඩයෙහි වර්ග අටක් දක්නට ලැබෙයි. එම කාණ්ඩය

අවසානයෙහි එම වර්ග නම්කොට ඇත. ස්වර්ග, ව්‍යෝම, කාල, ශබ්ද, නාට්‍ය, පාතාල, නරක, වාරි යනු එම වර්ග අටයි. භූම්‍යාදී කාණ්ඩයෙහි වර්ග දහයක් දක්නට ලැබෙයි. භූමි, පුර, ශෛල, වනෞෂධි, සිංහාදි, නෘ, බ්‍රහ්ම, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනු එම වර්ග දහයයි. සාමාන්‍ය කාණ්ඩයෙහි වර්ග පහක් දක්නට ලැබෙයි. විශේෂ, සංකීර්ණ, නානාර්ථ, අව්‍යය හා ලිංග යන පහයි.

ඉතා විශාල විෂය ක්ෂේත්‍රයක් ඇතුළත් ව තෝරාගත් වදන් සමූහයක් මේ එක් එක් වර්ගයක් යටතේ ප්‍රධාන විෂයවලට බෙදා එකකට එකක් සම්බන්ධ වචන සියල්ල එක්තැන් කිරීමෙන් ඒ ඒ විෂය පිළිබඳ ව තොරතුරු රාශියක් සපයන පරිදිදෙන් මෙය සකස් කොට ඇති බව පැහැදිලි ය. විවිධ ශාස්ත්‍ර විෂයන්හි දැක්වෙන ශබ්දකෝෂය අතිශයින් මහත් ය. ප්‍රයෝජනවත් ය. අමරකෝෂයේ වැදගත්කම පැහැදිලි වනුයේ එය චීන හා තිබ්බත භාෂාවලට ද පරිවර්තනය වීමෙනි. එමෙන් ම විශාල ව්‍යාඛ්‍යාන සංඛ්‍යාවක් රචනාකර ඇති බව මුලදී සඳහන් කළෙමු. ඒ අතර වැදගත් වූ කිහිපයක් මෙසේ ය.

ක්ෂීරස්වාමීන්ගේ **අමරකෝෂෝද්ඝාටනය**, සර්වානන්දගේ **ටීකාසර්වස්වය**, සුභූතිචන්ද්‍ර විරචිත කාමධේනුව සහ මහේෂ්වර විරචිත අමර විවේකය ද වැදගත්ය. **අමරකෝෂය විවේචනය** කරමින් ශ්‍රී හර්ෂ විසින් **අමරඛණ්ඩනය** රචිත ය.

## අමරසිංහට පසුව බිහි වූ කෝෂකරුවෝ

අමරසිංහයන් පෑදූ මාර්ගයෙහි ගමන් කොට කෝෂ සාහිත්‍යයට වැදගත් සේවයක් කළ පිරිසක් පසුකල පහළ විය. එම කෝෂ බොහොමයක් අමරසිංහ දක්වා නැති, එමෙන් ම අත්හැර දමා ඇති ශබ්ද හා පසුව ව්‍යවහාරයට පැමිණි ශබ්ද සංග්‍රහ කොට ඇත. අමරසිංහට පසුව හමුවන වැදගත් කෝෂකරුවා පුරුෂෝත්තම දේවයන් ය. ඔහු විසින් කෝෂ කෘති කිහිපයක් සම්පාදනය කොට ඇත. ඒවා අතර **ත්‍රිකාණ්ඩශේෂය** වැදගත් ය. එය අමරකෝෂයට අමතර කොටසක් හෙවත් අමරකෝෂය පරිපූර්ණ කිරීමට රචිත වූවක් ලෙස සැලකිය හැකිය. මොහු විසින් **හාරාවලී** සහ **වර්ණදේශනා** නැමැති කෝෂ කෘති දෙකක් ද, **ඒකාක්ෂරකෝෂ, ද්විරූපකෝෂ** නැමැති තවත් කෝෂ කෘති දෙකක් ද රචිත ය.

හලායුධයන්ගේ **අභිධාන රත්න මාලාව** පද්‍ය 900ක් ඇති කෙටි කෝෂයකි. තවද යාදව ප්‍රකාශයන්ගේ **වෛජයන්තිය** විශාල හා ක්‍රමවත් ව සකස් කළ කෝෂ ග්‍රන්ථයකි. දොළොස්වන සියවසට අයත් යැයි සලකනු ලබන හේමචන්ද්‍රයන්ගේ **අභිධානචින්තාමණිනාම මාලාව** වැදගත් වූ කෝෂ ග්‍රන්ථයක් ලෙස සලකනු ලැබේ. ජෛන දෙවිවරුන් ගැන මෙහි ආරම්භයෙහි සංග්‍රහ වෙයි. මේ ග්‍රන්ථයට ශ්ලෝක 396කින් යුත් උද්භිද විද්‍යාත්මක නිඝණ්ටුවක් ද ඇතුළත් වෙයි. මීට අමතර ව විවිධ විෂයයන්ට අදාළ කෝෂ ග්‍රන්ථ රාශියක් රචනා වී ඇත. වෛද්‍ය, ග්‍රහ, නක්ෂත්‍රවලට අදාළ නිඝණ්ටු සංග්‍රහ ද රචනා වී ඇත. විශේෂයෙන් බෞද්ධ කෝෂ ග්‍රන්ථ කිහිපයක් ද රචනා වී ඇත. සංස්කෘත භාෂාවෙන් ලද ආභාසයෙන් පාලි, ප්‍රකෘත ආදි භාෂාවල ද කෝෂ ග්‍රන්ථ බිහි වූ බව පැහැදිලිව දක්නට ලැබේ. **මහාව්‍යුත්පත්ති** නම් බෞද්ධ කෝෂ ග්‍රන්ථය ද, **පාඉයලච්ඡී නාමමාලාව** නම් ප්‍රාකෘත ග්‍රන්ථය ද නිදසුන් ලෙස දැක්විය හැකි ය.

## නිගමනය

සංස්කෘත විෂයයෙහි යුරෝපිය විද්වතුන් විසින් සම්පාදිතව තිබූ කෝෂකෘති විද්‍යානුකූලව සකස් වුයේ මෙම පැරණි කෝෂ කෘති අනුවය. සංස්කෘත විෂය හදාරන ශිෂයන් සැවොම මොනියර් විලියම්ස්ගේ **සංස්කෘත - ඉංග්‍රීසි ශබ්ද කෝෂය** බොහෝ සේ භාවිතය. ශිවරාම් ආප්තේ විසින් සම්පාදිත **සංස්කෘත - ඉංග්‍රීසි ශබ්දකෝෂයෙහි** කාව්‍යල නාට්‍ය, පුරාණ, ස්මෘති, දර්ශන, ව්‍යාකරණ, ඡන්දෝලංකාර, තන්ත්‍ර, ගණිත, ආයුර්වේද, නක්‍ෂත්‍ර, සංගීත ආදි විෂය රාශියකට අයත් ශබ්ද මෙන්ම ප්‍රධාන වෛදික ශබ්දද ඇතුළත්ය. මේ අනුව කෝෂ ග්‍රන්ථවලින් පාරිභාෂික ශබ්ද වාක් සම්ප්‍රදාය චරිත විස්තර හා නිරුක්ති, වාග් විද්‍යාත්මක තොරතුරු ද දතහැකිය. කෝෂ ග්‍රන්ථ භාෂාවක සමස්ත භාෂාවක සාහිත්‍යයේම සංක්ෂිප්ත එකතුවක් ලෙස දැක්වීම වරදක් නොවේ. මෙසේ ක්‍රමයෙන් විස්තෘත තත්ත්වයට පත් වූ සංස්කෘත කෝෂ සාහිත්‍යය තදීය භාෂා සාහිත්‍යය හඳුනා ගැනීමට මහත් පිටු බලයක් සපයන අතර භාෂාවේ පෘථුල බවට හා විදග්ධභාවයට හේතු කාරක වූ බව සත්‍යයකි.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

තිලකසිරි ජයදේව, (1999) **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෙරිඩේල් කීත්. ඒ, පරිවර්තනය - සේනානායක ජී. එස්. බී, (1965) **සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය**. කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මැක්ඩොනල්, ආතර්, ඒ, (1964) **ආධුනික සංස්කෘත ව්‍යාකරණය**. කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

වීරසූරිය ජිනසෝම, (1991) **සංස්කෘත කෝෂ සාහිත්‍යය**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න ආරියදාස (සංස්කරණය), (1998) **අභිධානප්පදීපිකා**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, ඩී.ඒ, (1963) **සිංහල විශ්ව කෝෂය**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Berriedale Keith.A, (1993) **A History of Sanskrit Literature**. Delhi: Motilal Banarsidass Publishers.

Sally Wehmeier (Editor), (2003) **Oxford Advance Learner's Dictionary**. Oxford University Press.

Winternitz.M, (1998) **History of Indian Literature Vol.111**. Delhi: Motilal Banarsidass Publishers.